සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**OLD**

**2563 – මූලික පිරිවෙන් අවසාන විභාගය – 2019 දෙසැම්බර්**
**(පැරණි නිර්දේශය)**

**S 02 I**

**(02) පාලි I පත්‍රය**

පැ තුනයි

**2019.12.23 /08.30 - 11.40**

අමතර කියවීම් කාලය -මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

I කොටසේ ප්‍රශ්නය ද, II කොටසේ දෙවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

1. පහත දැක්වෙන සියලු ම ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) පාලි භාෂාවේ තාලුජාක්ෂර ලියා දක්වන්න.

(ii) පාලි භාෂාවේ ඝෝෂ මහාප්‍රාණාක්ෂර ලියා දක්වන්න.

(iii) නීල + උප්පල යන පද දෙක බාලාවතාර සූත්‍ර ඇසුරින් සන්ධි කරන්න.

(iv) වග්ගන්තං වා වග්ගෙ යන සූත්‍රය හඳුන්වා උදාහරණ දෙකක් දෙන්න.

(v) සුර, චිත්ත, නදී, වාත යන පද අයත් වන ලිංග ලියා දක්වන්න.

(vi) කුමාරිරතනං, චතුසච්චං, බුද්ධදෙය්‍යං, ඩංසමකසං යන රූප අයත් වන සමාස පද ලියා දක්වන්න.

(vii) දහහතර, තිස්තුන, හැටදෙක, අසූනවය යන සංඛ්‍යා පාලියෙන් ලියන්න.

(viii) යානීධ, පරිළාහො, පටිසංඛායොනිසො, අත්තනි යන පදවල ව්‍යාකරණ ලක්ෂණ කවරේ දැයි දක්වන්න.

(ix) ලිංගාර්ථයෙහි ප්‍රථමා හා ඕකාසාර්ථයෙහි සත්තමී යන විභක්ති හඳුන්වා නිදසුන බැගින් දෙන්න.

(x) පහත දක්වා ඇති තද කළු අකුරින් මුද්‍රිත පදවල විභක්ති ප්‍රයෝග හඳුන්වන්න.

(අ) **මාසං** මංසොදනො

(ආ) අලං **තෙ** ඉධ වාසෙන

*(ලකුණු 4 × 10 = 40 යි)*

## II කොටස

2. (i) පහත දැක්වෙන ගද්‍ය පාඨය සිංහලයට නගන්න.

එකස්මිං කිර සමයෙ ලංකායං සද්ධාතිස්සො නාම රාජා රජ්ජං කාරෙති. තදා එකො රාජපුරිසො රඤ්ඤා පෙසිතො කොට්ඨසාලං අගමාසි, රාජකිච්චප්පසුතො. තස්මිං ගාමෙ මනුස්සා තස්ස ආගන්තුක සක්කාරං කරොන්තා සඝතං සව්‍යංජනං භොජනං සම්පාදෙත්වා කාලං ආරොචෙසුං. තතො තං භොජනත්ථාය නිසින්නකාලෙ එකො භික්ඛු භික්ඛං චරමානො අනුක්කමෙන තං ඨානං සම්පාපුණි. සො ථෙරං දිස්වා පසන්නො සමුපසංකමිත්වා පත්තං ගහෙත්වා ඝතසහිතභත්තං ථෙරස්ස අදාසි.

නැතහොත්

පහත දැක්වෙන පද්‍ය පාඨ සිංහලයට නගන්න.

අත්තූපමාය සබ්බෙසං - සත්තානං සුඛකාමතං,
පස්සිත්වා කමතො මෙත්තං - සබ්බසත්තෙසු භාවයෙ.

සුඛී භවෙය්‍යං නිද්දුක්ඛො - අහං නිච්චං අහං විය,
හිතා ච මෙ සුඛී හොන්තු - මජ්ඣත්තාවථ වෙරිනො.

ඉමම්හි ගාමක්ඛෙත්තම්හි - සත්තා හොන්තු සුඛී සදා,
තතොපරඤ්ච රජ්ජෙසු - චක්කවාළෙසු ජන්තුනො.

සමන්තා චක්කවාළෙසු - සත්තානන්තෙසු පාණිනො,
සුඛිනො පුග්ගලා භූතා - අත්තභාවගතා සියුං.

*(ලකුණු 07 යි)*

[දෙවන පිටුව බලන්න.

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

(ii) පහත දැක්වෙන එක් මාතෘකාවක් තෝරාගෙන වචන 25 කට නොඅඩු රචනයක් පාලි භාෂාවෙන් ලියන්න.

(අ) ධම්මාසොකො මහාරාජා

(ආ) සිරි සරණංකරසංඝරාජා

**නැතහොත්**

පහත දැක්වෙන වාක්‍ය පාලි භාෂාවට පරිවර්තනය කරන්න.

(අ) අනුරාධපුරය ශ්‍රී ලංකාවේ ඉතා පැරණි නගරයකි.

(ආ) එහි බොහෝ චෛත්‍ය දක්නට ලැබේ.

(ඉ) ජය ශ්‍රී මහාබෝධිය ද එහි පිහිටා ඇත.

(ඊ) මම අවුරුදු පතා එහි වන්දනාවේ යමි.

(ලකුණු 08 යි)

**3.** (i) "අග්ගි" (පුරුෂ ලිංගයෙහි) හා "රත්ති" (ස්ත්‍රී ලිංගයෙහි) යන ශබ්ද දෙක සියලු නාම විභක්තිවල හා වචනවල වරනගන්න. (ලකුණු 09 යි)

(ii) (අ) පුත්ත, ඛෙත්ත (ආ) අත්ත, රුක්ඛමූල (ඉ) විජ්ජාලය, සිප්ප යන පද යෝග්‍ය පරිදි සකස් කොට පිළිවෙළින් යොදා පහත සඳහන් වාක්‍යවල හිස්තැන් පුරවා නැවත ලියන්න.

(අ) අහං ............... සද්ධිං ............... කසාමි.

(ආ) කඤ්ඤා ............... ගාමං ගච්ඡන්ති ............... නිසීදති.

(ඉ) මම ධීතා ............... සම්මා ............... උග්ගණ්හාති. (ලකුණු 06 යි)

**4.** (i) "සස්ස නො" , "නදාදිතො වා ඊ" , "ගාව සෙ" යන සූත්‍රවල අරුත් දක්වා නිදසුන් සපයන්න. (ලකුණු 08 යි)

(ii) ද්වන්ද්ව සමාසය හඳුන්වා ඉතරීතරයෝගද්වන්ද්ව සමාස භේදය නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 07 යි)

**5.** (i) හීයත්තනී හෝ අජ්ජතනී ආඛ්‍යාතය හඳුන්වා භූ ධාතුව ඊට අයත් කර්තෘකාරක පරස්සපදයෙහි ඒක වචන - බහු වචන දෙකෙහි වරනගන්න. (ලකුණු 09 යි)

(ii) පහත දක්වෙන ක්‍රියාරූප අයත් වන ආඛ්‍යාත විභක්ති නම් කරන්න.

ගච්ඡෙය්‍ය, කරිස්සාමි, සුණාතු, නිසීදිංසු, එරි, අපචිස්සං (ලකුණු 06 යි)

**6.** (i) අව්‍යය තද්ධිතය හඳුන්වා ඒ සඳහා යෙදෙන ප්‍රත්‍යය නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 09 යි)

(ii) ධම්මිකො, භාගිනෙය්‍යො, තෙලිකො, පච්ඡිමො, සංඝික, මානව යන පදවල තද්ධිත ප්‍රත්‍යය ලියා දක්වන්න. (ලකුණු 06 යි)

**7.** (i) අනීය, ණවු, ත්වා යන කෘදන්ත ප්‍රත්‍යය හඳුන්වා එකකට නිදසුන් දෙක බැගින් සපයන්න. (ලකුණු 09 යි)

(ii) භයදස්සාවී, භවන්ත, පාපාකාරී, ඤෙය්‍යො, කාරිය, දඩ්ඪ යන කෘදන්ත පදවල ප්‍රත්‍යය වෙන් කොට දක්වන්න. (ලකුණු 06 යි)

**8.** (i) "අක්ඛර නියමො ඡන්දං - ගරුලහුනියමො භවෙ වුත්ති
දීඝො සංයොගාදිපුබ්බො - රස්සො ච ගරු ලහු තු රස්සො" යන බාලාවතාර ගාථාවේ අදහස කෙටියෙන් දක්වා ගුරු-ලුහු භේදය යනු කුමක් දැයි නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 09 යි)

(ii) පහත දැක්වෙන තද කළු අකුරෙන් මුද්‍රිත පදවල කාරක ලක්ෂණ හඳුන්වන්න.

(අ) **මං** නාලපිස්සති

(ආ) **පුබ්බණ්හසමයං** නිවාසෙත්වා (ලකුණු 06 යි)

* * *

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි/
முழுப் பதிப்புரிமையுடையது/
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**OLD** **2563 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2019 දෙසැම්බර්** **02 | S | II**

**(පැරණි නිර්දේශය)**

**(02) පාලි - II පත්‍රය**

**2019.12.23 /12.30 - 15.40**

පැ තුනයි

අමතර කියවීම් කාලය -මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

I කොටසේ හා II කොටසේ ප්‍රශ්න සියල්ල ම ද, III කොටසින් ප්‍රශ්න එකක් ද තෝරා ගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** පහත දැක්වෙන (i) සිට (xv) තෙක් ඇති සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- පහත සඳහන් වාක්‍යවල හිස්තැන්වලට සුදුසු පිළිතුරු වරහන් තුළින් තෝරා, හිස්තැන් පුරවා වාක්‍ය නැවත ලියන්න. *(ලකුණු 20 යි)*

(i) (අ) බුදුරජාණන් වහන්සේ දෙවුරුම් වෙහෙරේ ...................... (විසිවසරක් / දහනව වසරක්) වස් විසූ සේක.

(ආ) වෛද්‍යවරයා විසින් ඇස් අන්ධ වන බෙහෙතක් පිළියෙල කර දුන්නේ ...................... (ඇස් රෝගයෙන් පෙළුණු කාන්තාවට / චක්ඛුපාල හිමියන්ට) ය.

(ii) (අ) තම රත්රන් රථයට රෝද දෙකක් නැතැ යි කියමින් ඇඬුවේ ...................... (මට්ටකුණ්ඩලී දිව්‍ය පුත්‍රයා /අදින්නපුබ්බක බ්‍රාහ්මණයා) ය.

(ආ) ථුල්ලතිස්ස හිමි අතීත භවයක ...................... (නාරද / දේවල) නම් තවුසෙක් විය.

(iii) (අ) දඨාවංසය පාලියෙන් රචනා කළේ ...................... (දීපවාසීන්ගේ / දීපන්තරවාසීන්ගේ) ප්‍රයෝජනය සඳහා ය.

(ආ) ...................... (දීපංකර / තණ්හංකර) බුදු හිමියන්ට මඩ වලෙන් එතර වීමට සුමේධ තාපසතුමා ඒ දණ්ඩක් මෙන් වැතිරුණේ ය.

(iv) (අ) බුද්ධත්වයෙන් ...................... (අටවැනි / නවවැනි) වස බුදුරජාණෝ කැලණියට වැඩි සේක.

(ආ) බුද්ධත්වයෙන් ...................... (අටවැනි / පස්වැනි) වස බුදුරජාණෝ නාගදීපයට වැඩි සේක.

(v) (අ) ...................... (පළමු / දෙවැනි) සංගායනාවේ දී උපාලි හිමි විනය ගැටලු විසඳී ය.

(ආ) දෙවැනි ධර්ම සංගායනාව ...................... (සත්තසතිකා / පංචසතිකා) නමින් ද හැඳින්වේ.

- පහත සඳහන් පාලි පාඨ සිංහලට නගන්න. *(ලකුණු 20 යි)*

(vi) තස්ස පාදාරවින්දං සිරසා නමාමි.

(vii) තෙන කුසලෙන විහත අන්තරායො හොතු.

(viii) ජිනසාසනස්ස වංසං සංඛිපිත්වා වක්කාමි.

(ix) සීහලෙ කවීහි ජිනදන්තධාතුයා වංසං සදෙසභාසාය කතං.

(x) මහාදයො කලලං අනක්කමිත්වා සභික්ඛුකො පිට්ඨියා ගච්ඡතු.

(xi) ජිනො සුරදුන්දුභිස්සරෙ පවත්තමානෙ බොධිං අබුජ්ඣි.

(xii) සත්‍ථා උදකං තෙ තාපිතං පාරිලෙය්‍යක ඉති වත්වා තත්‍ථ ගන්ත්වා නහායති.

[දෙවැනි පිටුව බලන්න.

(xiii) සා කුක්කුටී හුත්වා කුක්කුටණ්ඩානි විජායි.

(xiv) තත්‍ර නං සීසෙ මත්තිකා පිණ්ඩං කත්වා ගලප්පමාණෙ උදකෙ ඨපාපෙසි.

(xv) සූරියෙ උදයන්තෙ තෙ මුද්ධා සත්තධා ඵලතු.

## II කොටස

**2.** (i) සිංහලට පරිවර්තනය කරන්න. *(ලකුණු 10 යි)*

සො තාය ආකිණ්ණවිහාරතාය උක්කණ්ඨිතො අහං ඛො ඉදානි ආකිණ්ණො දුක්ඛං විහරාමි. ඉමෙ ච භික්ඛූ මම වචනං න කරොන්ති. යන්නූනාහං එකකොව ගණම්හා වූපකට්ඨො විහරෙය්‍යන්ති චින්තෙත්වා කොසම්බියං පිණ්ඩාය චරිත්වා අනපලොකෙත්වා භික්ඛුසඞ්ඝං එකකොව අත්තනො පත්තචීවරමාදාය බාලකලොණකාරාමං ගන්ත්වා තත්‍ථ භගුත්ථෙරස්ස එකචාරික වත්තං කථෙත්වා පාචීන වංස මිගදායෙ තිණ්ණං කුලපුත්තානං සාමග්ගි රසානිසංසං කථෙත්වා යෙන පාරිලෙය්‍යකං තදවසරි. තත්‍ර සුදං භගවා පාරිලෙය්‍යකං උපනිස්සාය රක්ඛිත වනසණ්ඩෙ භද්දසාල මූලෙ පාරිලෙය්‍යකෙන හත්ථිනා උපට්ඨහියමානො ඵාසුකං වස්සාවාසං වසි.

(ii) "සුඛා සඞ්ඝස්ස සාමග්ගි" යන සම්බුද්ධ වචනය ඇගයීමට ලක් කරන්න. *(ලකුණු 05 යි)*

**3.** (i) සිංහලට නගන්න. *(ලකුණු 10 යි)*

තතො පට්ඨාය සො සත්ථා විනෙන්තො දෙවමානුසෙ,
බෝධිතො ඵුස්සමාසම්හි නවමෙ පුණ්ණමාසියං.

ලඞ්කාමාගම්ම ගංගාය තීරෙ යොජන විත්ථතෙ,
මහානාග වනුය්‍යානෙ ආයාමෙන තියොජනෙ.

යක්ඛානං සමිතිං ගන්ත්වා ඨත්වාන භගවා තහිං,
වාතන්ධකාරවුට්ඨීහි කත්වා යක්ඛෙ භයද්දිතෙ.

ලද්ධාභයෙහි යක්ඛෙහි තෙහි දින්නාය භූමියා,
චම්මඛණ්ඩං පසාරෙත්වා නිසීදිත්වාන තං ඛණෙ.

චම්මඛණ්ඩං පදිත්තග්ගි ජාලමාලා සමාකුලං,
ඉද්ධියා වඩ්ඪයිත්වාන යාවසින්ධුං සමන්තතො.

ජවෙන සින්ධුවෙලාය රාසිභූතෙ නිසාචරෙ,
ගිරිදීපමිධානෙත්වා පතිට්ඨාපෙසි තෙ තහිං.

(ii) සම්බුදුරදුන්ගේ ලංකාගමනය පිළිබඳ පුවත් විස්තර කරන්න. *(ලකුණු 05 යි)*

**4.** (i) සිංහලට නගන්න. *(ලකුණු 10 යි)*

සංගීතං හි තතියා පුරාකතා ද්වෙ
නිස්සාය විස්සුතවතී ථවිරුත්තමෙහි,
යස්මා සහස්ස පමිතෙහි කතාසි තෙහි
තස්මා විදූහි විදිතාසි සහස්සිකාති.

[ තුන්වැනි පිටුව බලන්න

Department of Examinations Sri Lanka

කත්වාන මොග්ගලිසුතප්පමුඛාභිවුද්ධිං
ථෙරොති සාසනවරස්සථ සුට්ඨිතත්තං,
මජ්ඣන්තිකාදි ථවිරෙ පහිණීය තං තං
පච්චන්ත දෙසමපි තෙ පුන නිබ්බුතාසුං.

සම්පෙසිතො කිර තදට්ඨමහා යතින්දා
මජ්ඣන්තිකාදි විදිතා සකපක්ඛවමා'ච,
පච්චන්තිමං සමුපගම්ම තහිං තහිං පි
සණ්ඨාපයිංසු ජිනසාසනමුත්තමං තෙ.

(ii) තුන්වැනි ධර්මසංගායනාවෙන් පසු විදේශවලට ධර්මදූතයන් යැවීම පිළිබඳ විස්තරයක් කරන්න.
*(ලකුණු 05 යි)*

**III කොටස**

**5.** "ධම්මපද ගාථාවල පසුබිම විස්තර කිරීම ධම්මපද අට්ඨකථාවෙන් අපේක්ෂිත ය'' යන ප්‍රකාශය තහවුරු කරන්න.
*(ලකුණු 15 යි)*

**6.** "බුද්ධත්වයෙන් පසු සිදු වූ අසිරිමත් සිදුවීම් දාඨාවංසයේ රසාත්මක ලෙස වර්ණිත ය.'' යන ප්‍රකාශය උදාහරණ සහිත ව අවධාරණය කරන්න.
*(ලකුණු 15 යි)*

***

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka